*සැ. යු.* - 2015.01.02 දින පළ වූ අංක 1,896 දරන ගැසට් පත්‍රයේ III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,897 - 2015 ජනවාරි මස 09 වැනි සිකුරාදා - 2015.01.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 42 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 43 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජනවාරි මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජනවාරි මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2015 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පමුණුගම, වැලිකැටිය, ඉඳිගස්ලන්ද අංක 387/සී හි පදිංචි උඩුගම කෝරාලලාගේ සුමුදු පෙරේරා (ජා. හැ. අංක 817743110 V සහ ශ්‍රී ලංකා පාස්පෝට් අංක N 1909214) වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි පොදු ජනතාව වෙත මෙයින් දන්වා සිටින්නේ, මා විසින් පමුණුගම, වැලිකැටිය, ඉඳිගස්ලන්ද අංක 387/සී හි පදිංචි උඩුගම කෝරාලලාගේ සඳුන් පෙරේරා (ජා. හැ. අංක 860150018 V) යන අයට බලය පවරණ ලද, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් කැන්සියස් අමරතුංග විසින් 2008 දෙසැම්බර් මස 22 වැනි දින සකස් කර ලියා සහතික කළ අංක 35 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අහෝසිකර අවලංගු කරන බවත්, එකී ඇටෝර්නි බලකරු විසින් සිදු කරන කිසිදු ගනුදෙනුවකට හෝ කටයුත්තකට මින් ඉදිරියේ දී වග නො කියන බවත් ය.

උඩුගම කෝරාලලාගේ සුමුදු පෙරේරා.

01-220

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : වී ත්‍රී එනර්ජි සොලුෂන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : PV 101991
ලියාපදිංචි කළ දිනය : 2014 නොවැම්බර් මස 07
ලියාපදිංචි කාර්යාලය : අංක 16 ඒ - 1/1, යසෝදරා මාවත, ශ්‍රී සරනංකාර පාර, දෙහිවල.

එස්. රාජකුලේන්ද්‍ර මිය,
නීතිඥ,
(සමාගම් ලේකම්).

අංක 34/1, නෙල්සන් පෙදෙස,
වැල්ලවත්ත,
කොළඹ 06.

01-275

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : එස් ඇන්ඩ් එස් ෆැබ්රිකේටර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 102325
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 31, 4 වැනි පටුමග, ජෝර්ජ් ඊ ඩී සිල්වා මාවත, මහනුවර.
සමාගම ලියාපදිංචි කල දිනය : 2014.11.21

01-299

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ආර්. සී. අමරසේකර අඑ. ක්‍රාෆ්ට් ඉංජිනියර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 102324
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 50/9, මැද බෝවල, මහනුවර
සමාගම ලියාපදිංචි කල දිනය : 2014.11.24

01-300

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

වත්තල, හැදල, ඇවරිවත්ත පාර, තෝමස් කාදිනල් කුරේ මාවත අංක 62/3 හි පදිංචි කොම්බන් ආරච්චිලාගේ කුමාරි මානෙල් පෙරේරා වන මම, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. එම්. නවාස් මහතා විසින් වර්ෂ 2010 අගෝස්තු මස 01 වැනි දින සහතික කරන ලද අංක 776 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් එහි ඇටෝර්නි බලකරු වන වත්තල, හුනුපිටිය, නන්දන මාවත, අංක 402 හි පදිංචි ක්‍රිෂ්ණසාමි සර්වේස්වරන් යන අය පත්කොට ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන බවත්, එකී ඇටෝර්නි බලකරු විසින් සිදු කරන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වගකීමෙන් නොබැඳෙන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

කොම්බන් ආරච්චිලාගේ කුමාරි මානෙල් පෙරේරා.

2014 දෙසැම්බර් මස 02 වැනි දින.

01-318/1

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

කැලණිය, ගෝනවල, පැලැන්ගහහේන, අංක 702/7A හි පදිංචි කොහොඹන් ආරච්චිගේ කුමාරි මානෙල් පෙරේරා වන මම, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. පී. පී. වී. කේ. ඩයස් ගුණසේකර මහත්මිය විසින් වර්ෂ 2014 නොවැම්බර් මස 19 වැනි දින සහතික කරන ලද අංක 794 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් එහි ඇටෝර්නි බලකරු වන බොරලැස්ගමුව, මහරගම පාර, 1 වැනි පටුමග, අංක 35/F 1 හි පදිංචි කුරුවිටගේ නිල්මිනී ප්‍රියන්තිකා යන අය පත්කොට ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන බවත්, එකී ඇටෝර්නි බලකරු විසින් සිදු කරන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වගකීමෙන් නොබැඳෙන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

කොම්බන් ආරච්චිගේ කුමාරි මානෙල් පෙරේරා.

2014 දෙසැම්බර් මස 12 වැනි දින.

01-318/2

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු :-

| *ලියාපදිංචි සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|
| පියෝලින් ඉන්ටර්නැෂනල් ට්‍රේඩිං කම්පැනි (පීවීටී/එල්ටීඩී | පී වී 102129 | 2014.11.25 | අංක එෆ් 71, අතුල මාවත, ගල්කිස්ස. |
| මයිචොයිස් කේටරින් (පී වී ටී) එල්ටීඩී | පී වී 71718 | 2010.03.26 | අංක 6, ජනරට මාවත, ගම්පහ. |

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (පීවීටී) එල්. ටී. ඩී.,
සමාගම් ලේකම්වරු.

01-271

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේ දී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, (පානදුර ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත) පානදුර ප්‍රාදේශීය සභාවේ පානදුර තොටමුනෙහි තල්පිටි දෙබැද්ද කෙසෙල්වත්ත උප කාර්යාල සීමාව ඇතුළත, කෙසෙල්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුලත, කෙසෙල්වත්ත ග්‍රාමයෙහි පිහිටා ඇති දිග්ගල තොටුපල පාරේ වරිපනම් අංක 294/106 දරන, බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් සකසන ලද අංක 1309 සහ 1997 ඔක්තෝබර් මස 09 වැනි දින දරන පිඹුරෙහි දක්වා ඇති බෙලිදූව දූපත (බෙලිදූව අයිලන්ඩ්) නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 34 දරන ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිල්ල, ගහකොළ වැවිලි සහ සියලු දේත් සමග වන ඉඩම් වේ.

(බිම් ප්‍රමාණය අ. 0, රූ. 1, පර්. 13.34)
වර්ෂ 2015 ක් වූ ජනවාරි මස 30 වැනි දින පෙ. ව. 10.30 ට.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කොළඹ සිට පරණ ගාලු පාර දිගේ කෙසෙල් වත්ත හන්දිය දක්වා කි. මී. 22 1/2ක් පමණ ගමන් කර වමට හැරී දිග්ගල පාර දිගේ රස්කින් දූපතට ඇති බෝට්ටු සේවාව ආරම්භ වන ස්ථානය දක්වා කි. මී. 2ක් පමණ ඉදිරියට ගමන් කරන්න. ඉන්පසු තවදුරටත් බොල්ගොඩ ලේක් මතින් රස්කින් දූපත වෙත බෝට්ටු සේවාව මගින් ගමන් කර පොදු පාර දිගේ ගමන් කළ විට විෂයගත දේපළට පිවිසිය හැක.

අනිෂ්ක රංජිවී ෆොන්සේකා ද සිල්වා විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ආර්. එල්. සී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.06.19 දිනැති අංක 371 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ වර්ෂ 2014.03.03 දිනැති අංක 491 දරන ද්විතීයික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.12.26 වැනි දින ඩෙයිලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් සහ එදින ගැසට් පත ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකක්) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
(4) ප්‍රචාරක වියදම් ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
(6) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු ප්‍රධානී - නීති පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාල අංක 450, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංක : 256573/2565565.

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3(50/3), විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011 3068185
ෆැක්ස් අංකය : 011- 2572940

01- 329

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

කේ. එම්. වගච්චි.
ගිණුම් අංක : 0074 5000 1303.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008.01.31 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ සහ මෙහි දෙවැනි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ (මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළෙහි නැවත මිනුම් සහ උප බෙදුම් වන) රුපියල් දහ නම ලක්ෂ හැත්තෑ දහස් තුන්සිය අනූ හයයි ශත හැට හතරක (රු. 1,970,396.64) මුදල ද, 2014.03.11 වැනි දින සිට අංක 275 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් ලක්ෂ හාර දහසක (රු. 3,04,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම පහක් (17.5%) හා තවත් රුපියල් දහ හතර ලක්ෂ තිස් අට දහස් හැත්තෑ හතරයි ශත හැට නමයක (රු. 1,438,074.69) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම පහක් (13.5%) 2013.03.10 දිට අය කිරීම සඳහා 2007 නොවැම්බර් මස 01 වැනි දින සිට මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහ හතර ලක්ෂ හතලිස් හය දහස් හාරසිය තිස් එකයි ශත හතලිස් පහක (රු. 1,446,431.45) මුදලකට අඩු කරනු ලැබ ඇති රුපියල් දොළොස් ලක්ෂ තිස් අට දහස් අටසිය අසූ හතරයි ශත අසූ දෙකක (රු. 1,238,884.82) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවක් (15%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පළමු උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2010.06.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2010.06.02 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි සහ දෙවැනි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2015.01.29 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**පළමු උපලේඛනය**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ වැදිරට කෝරළේ බුත්තල හුලංදව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හුලංදව පිහිටි එකී ප්‍රදානය කරන ලද ඔප්පු අංක මො/ප්‍ර 54664 හි නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : උක්කුනයිදේගේ ඉඩම නැගෙනහිරට : කෘෂිකර්ම මධ්‍යස්ථානයට අයිති ඉඩම, දකුණට : මාටින් සිල්වාට අයිති ඉඩම සහ බස්නාහිරට : අප්පුනයිදේගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකක් (අ. 1, රූ. 0 පර්. 0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී ප්‍රදානය කරන ලද ඔප්පු අංක මො/ප්‍ර 54664 දරන ප්‍රදාන ඔප්පුව ප්‍රකාර වෙළුම/පත්‍රිරුව LDOL/40/151 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන පී. බී. ඉලංගසිංහ යන අය විසින් සාදන ලද 2004 ජුනි 14 දාතම හා අංක MO/275 දරන පිඹුරේ නිරූපිත එකී ඉඩම් කොටස නැවත මැන දැන් ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇත.

**දෙවන උපලේඛනය**

1. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැදිරට කෝරළේ බුත්තල හුලංදව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හුලංදව පිහිටි බලයලත් මානක තැන ටී. බී. අත්තනායක යන අය විසින් සාදන ලද 2010.08.26 දාතම හා අංක 3600 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අප්පුනයිදේගේ ඉඩම ලොට් 3, සහ 4 නැගෙනහිරට : ලොට් 1, 3 සහ 4 (අඩි 12 පළල පිවිසුම් මාර්ගය) දකුණට : මාටින් සිල්වාට අයිති ඉඩම සහ ලොට් 1 සහ බස්නාහිරට : මාටින් සිල්වාට සහ අප්පුනයිදේගේ ඉඩම් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හතයි දශම හතරක් (අ. 0 රූ. 0 පර්. 27.4) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සම්පූර්ණයෙන් ම සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3600 දරන පිඹුරට අනුවය.

2. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ වැදිරට කෝරළේ බුත්තල හුලංදාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හුලංදව පිහිටි බලයලත් මානක තැන ටී. බී. අත්තනායක යන අය විසින් සාදන ලද 2010.08.26 දාතම හා අංක 3600 දරන පිඹුරේ ලොට් 3 වශයෙන් නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 715 (FVP 172 හි පාර) උක්කුනයිදේගේ සහ අප්පුනයිදේගේ ඉඩම් නැගෙනහිරː ලොට් 715 (FVP 172 හි පාර) සහ ලොට් 4 (අඩි 12 පළල පිවිසුම් මාර්ගය) දකුණට : ලොට් 2 සහ 4 (අඩි 12 පළල පිවිසුම් මාර්ගය) සහ බස්නාහිරට : උක්කුනයිදේගේ සහ අප්පුනයිදේගේ ඉඩම් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අ. 0 රූ. 2 පර්. 0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සම්පූර්ණයෙන් ම සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් , පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3600 දරන පිඹුරට අනුවය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

01-321

### සෙලාන් බැංකුව පීඑල්සී - පානදුර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ දෙදෙනාම පානදුර පදිංචි දොන් ප්‍රසන්න වික්‍රමසිංහ සහ දොන් ෂොක්මන් වික්‍රමසිංහ යන අය බන්ධනදායින් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ, පානදුර තල්පිටි දෙබැද්ද වඳුරාමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු පී. අබේපිටිය විසින් සාදන ලද 1984.07.22 දිනැති අංක 1817 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මූනමල්ගහවත්ත නමැති ගොඩනැගිලි ගස්, වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 3 ලකුණු කළ ඉඩම් කොටස එකී අංක 1817 සැලැස්ම අනුව රූඩ් එකයි, පර්චස් හතරයි දශම අටයි බිංදුවක් (අ. 0 රූ. 1 පර්. 4.80) විශාල ඉඩම.

එකී ලොට් 3 දැන් නැවත මැන ඇති අතර, බලයලත් මිනින්දෝරු ඩී. ආර්. කුමාරගේ විසින් සාදන ලද 2000.06.08 දිනැති අංක 1035 දරන සැලැස්මේ නිරූපනය කර පහත සඳහන් පරිදි සවිස්තරව විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ, පානදුර තල්පිටි දෙබැද්ද බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ වඳුරමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ආර්. කුමාරගේ විසින් සාදන ලද 2000.06.08 දිනැති අංක 1035 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මූනමල්ගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 3 ලකුණු කළ ඉඩම් කොටස එකී අංක 1035 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් හතරයි දශම අටක් (අ. 0 රූ. 1 පර්. 4.8) ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2015 ජනවාරි මස 30 වැනි දින පස්වරු 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - පානදුර ඔරලෝසු කණුව මංසන්ධියේ සිට හොරණ පාර ඔස්සේ කි. මී. 2.5 ක පමණ දුරක් ගොස් එළුවිල මංසන්ධිය දක්වා පැමිණ වම්පසට ඇති කිරිබේරිය පාරට හැරෙන්න. එම මාර්ගය ඔස්සේ තවත් කි. මී. 1 ක පමණ දුරක් ගොස් (බුදුපිළිමය සහ පිනාල පාර පසුකළ විට) දකුණු පසට ඇති කනත්ත පාරට හැරී තවත් මීටර් 50 ක පමණ දුරක් ගිය විට මාර්ගයේ වම්පසින් අදාල දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ* 2014.11.21 වැනි දින පළවී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2014.11.15 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2014.10.31 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්. ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිනිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දුරකථන අංක : 011 2456479, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011- 3068185, 011- 2572940.

01-283

---

### ඩී. එෆ්. සී. සී. බැංකුව

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 2051 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමාව සහ කඩවත් සීමාවට අයත්, උප්පුවේලි ග්‍රාමයේ පිහිටි, පාතයඩිවලවූ ලෙස හැඳින්වෙන ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු පී. මහේන්ද්‍රනාදන් විසින් සාදන ලද 2003 අගෝස්තු මස 27 වැනි දිනැති අංක 834 දරන පිඹුරේ ලොට් අංක 2, 3 සහ 4 ලෙස දැක්වෙන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 01 පර්. 20.63

ඉහත කී පාතයඩිවලවූ ලෙස හැඳින්වෙන, ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු පී. මහෙන්ද්‍රනාදන් විසින් සාදන ලද 2003 අගෝස්තු මස 27 වැනි දිනැති අංක 834 දරන පිඹුරේ ලොට් අංක 2, 3 සහ 4 ලෙස දැක්වෙන බිම් කට්ටියේ නැවත මිනුම් පහත පරිදි වේ.

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමාව සහ කඩවත් සීමාවට සහ ත්‍රිකුණාමලය ප්‍රාදේශීය සභා සීමාවට අයත්, උප්පුවේලි 243 ග්‍රාම නිලධාරී වසමේ, කොට්ඨාශ අංක 04 හි උප්පුවේලි පිහිටි, අංක 24/1 සහ 24/2 තට්ටකයි පාර, ත්‍රිකුණාමලය යන ලිපිනය දරන ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු පී. මහේන්ද්‍රනාදන් විසින් සාදන ලද 2011 සැප්තැම්බර් මස 10 වැනි දිනැති අංක 834 බී දරන පිඹුරේ ලොට් අංක ඒ ලෙස දැක්වෙන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 01 පර්. 8.75

එහි පිහිටි ගොඩනැගිල්ල සහ ඊට අදාළ සියලුම අයිතීන් සමග ත්‍රිකුණාමලය ප්‍රසිද්ධ නොතාරිස් ටී. තුෂ්‍යන්තන් විසින් සහතික කරන ලද, 2013 මාර්තු මස 18 වැනි දිනැති අංක 2051 දරන උකස්කරය ප්‍රකාර, ත්‍රිකුණාමලය ලහිරු හාඩ්වෙයාර් නම් ව්‍යාපාරය පවත්වාගෙන යන සෙල්ලතුරෙ සාන්තලින්ගම් විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2015 ජනවාරි මස 27 වැනි දින (අගහරුවාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර),
4. රු. 1,28,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ශොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 123 ක සේවා විශිෂ්ටත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

01-222

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.